සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 10 | |
| 03 | 11 - 14 | |
| 04 | 15 - 21 | |
| 05 | 22 - 29 | |
| 06 | 30 - 37 | |
| 07 | 38 - 44 | |
| 08 | 45 - 50 | |
| එකතුව | | |

විභාග අංකය : ..................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
* අංක **1** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

**1.** ආර්ථික විද්‍යාවේ 'හිඟකම' සංකල්පයෙන් අදහස් කරනුයේ,
(1) සමාජය තමන් සතු සියලු සම්පත් කාර්යක්ෂමව උපයෝජනය නොකරන තත්ත්වයකි.
(2) පවත්නා සම්පත්වලින් මිනිසුන්ගේ වුවමනා කිසිසේත් සපුරාගත නොහැකි තත්ත්වයකි.
(3) සෑම සමාජයක ම කිසියම් සාමාජික පිරිසක් දිළින්දන් ලෙස ජීවත් වන තත්ත්වයකි.
(4) සමාජයීය වශයෙන් හිතකර භාණ්ඩ හා සේවා නිපදවනවා වෙනුවට, නොවැදගත් භාණ්ඩ හා සේවා වුවමනාවටත් වඩා නිපදවන තත්ත්වයකි.
(5) නිෂ්පාදනය කාර්යක්ෂම වුවත් බෙදාහැරීම අකාර්යක්ෂමව පවතින තත්ත්වයකි. (......)

**2.** නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර, මූලයට අවතල හැඩයකින් යුතුව අඳිනු ලබන්නේ,
(1) කවර හෝ භාණ්ඩයක් වැඩිපුර නිපදවන විට, එහි ආවස්ථික පිරිවැය පහළ බසින බව පිළිබිඹු කිරීමට ය.
(2) ආර්ථිකය සතු සම්පත්වල හිඟකම පිළිබිඹු කිරීමට ය.
(3) කවර හෝ භාණ්ඩයක් වැඩිපුර නිපදවන විට, එහි ආවස්ථික පිරිවැය ස්ථාවරව පවතින බව පිළිබිඹු කිරීමට ය.
(4) ආර්ථිකයක සම්පත් බෙදීයාමේ අසාධාරණත්වය පිළිබිඹු කිරීමට ය.
(5) කවර හෝ භාණ්ඩයක් වැඩිපුර නිපදවන විට, එහි ආවස්ථික පිරිවැය ඉහළ නගින බව පිළිබිඹු කිරීමට ය. (......)

**3.** නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක පහත සඳහන් කවර කරුණක් **සාවද්‍ය** වේ ද?
(1) මිල, ආර්ථිකයේ තරඟකාරී නිෂ්පාදන ක්ෂේත්‍ර අතර සම්පත් සමසේ බෙදා වෙන් කරයි.
(2) මිල, භාණ්ඩ හා සේවාවන්හි සාපේක්ෂ හිඟකම් සහ ඒවායේ නිෂ්පාදන පිරිවැය පෙන්නුම් කරයි.
(3) සාපේක්ෂ මිල වෙනස්කම්, නිෂ්පාදන ආයතනවල ලාභ නිර්ණය කරන සාධකයක් වන අතර, එබැවින් එය නිෂ්පාදනය ධෛර්යමත් කිරීමට හෝ අධෛර්යමත් කිරීමට හෝ බලපායි.
(4) මිල, භාණ්ඩ හා සේවා සඳහා පාරිභෝගිකයන්ගේ ගෙවීමට ඇති කැමැත්ත පිළිබඳ මිනුමක් වේ.
(5) මිල, භාණ්ඩයක් ලබා ගැනීම සඳහා කොපමණ කැප කළ යුතු ද යන්න පිළිබඳ සංඥාවක් පාරිභෝගිකයන්ට ලබා දෙයි. (......)

PAPERMASTER.LK

**4.** බාහිරතා නොමැති තරගකාරී වෙළෙඳපොළක සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව හටගනු ඇත්තේ සියලු වෙළෙඳපොළවල මිල,
(1) මුළු පිරිවැයට සමාන වන විට දී ය.
(2) ආන්තික අයභාරයට සමාන වන විට දී ය.
(3) ආන්තික පිරිවැයට සමාන වන විට දී ය.
(4) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන විට දී ය.
(5) ආන්තික නිෂ්පාදිතයේ වටිනාකමට සමාන වන විට දී ය. (……)

**5.** 'මානව ප්‍රාග්ධනය' යන්නෙන් අදහස් කරනුයේ,
(1) ප්‍රාග්ධන උපකරණ නිපදවීමට යොදා ගැනෙන ශ්‍රම සම්පතයි.
(2) ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍රයි.
(3) ශ්‍රම හමුදාව සතු කුසලතා සහ දැනුම් සම්භාරයයි.
(4) ව්‍යවසායකත්වය සහ අවදානම් දැරීමේ හැකියාවයි.
(5) සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි සේවා නියුක්ත ශ්‍රම හමුදාවයි. (……)

**6.** විභව නිමැවුම යනු,
(1) පසුගිය දසවසර තුළ ආර්ථිකයක් සැබවින් ම අත්කර ගත් උපරිම දළ දේශීය නිෂ්පාදිතය වේ.
(2) සමස්ත ශ්‍රම හමුදාව ම වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදන අංශයේ සේවා නියුක්ත වූ කාල පරිච්ඡේදවල දී අත්කර ගත් නිමැවුම වේ.
(3) සියලු සම්පත් වඩා කාර්යක්ෂමව යොදා ගැනීමෙන් ආර්ථිකයට කිසිවිටක අත්කර ගත නොහැකි අරමුණකි.
(4) ආර්ථිකයේ සම්පත් පූර්ණ සේවා නියුක්තව, ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කරන විට නිපදවිය හැකි දළ දේශීය නිෂ්පාදිතය වේ.
(5) ආර්ථිකයේ සම්පත් පූර්ණ සේවා නියුක්තව, උපරිම මට්ටමින් උපයෝජනය කරන විට නිපදවිය හැකි දළ දේශීය නිෂ්පාදිතය වේ. (……)

**7.** X භාණ්ඩය බාල භාණ්ඩයක් බවත්, තරගකාරී වෙළෙඳපොළක අලෙවි කරනු ලබන බවත් සලකන්න. X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී, ගැනුම්කරුවන්ගේ ආදායමේ පහළ බැසීමක් නිසා වෙළෙඳපොළ ඉල්ලුම, සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය මත කෙබඳු බලපෑමක් ඇති වේ ද?

| | ඉල්ලුම | මිල | ප්‍රමාණය |
|---|---|---|---|
| (1) | අඩු වේ. | අඩු වේ. | අඩු වේ. |
| (2) | වැඩි වේ. | වැඩි වේ. | වැඩි වේ. |
| (3) | අඩු වේ. | වැඩි වේ. | අඩු වේ. |
| (4) | වැඩි වේ. | අඩු වේ. | අඩු වේ. |
| (5) | අඩු වේ. | වැඩි වේ. | වැඩි වේ. |

(……)

**8.** කිසියම් අත්‍යවශ්‍ය භාණ්ඩයක් මත විශේෂිත බද්දක් (ඒකක බද්දක්) පනවනු ලබන අතර, එම භාණ්ඩයේ වෙළෙඳපොළ ඉල්ලුම් ලේඛනයත්, බද්දට පෙර හා බද්දට පසු සැපයුම් ලේඛනයත් පහත දැක්වෙන වගුව පෙන්නුම් කරයි.

| මිල (රු.) | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය | බද්දට පෙර සැපයුම් ප්‍රමාණය | බද්දට පසු සැපයුම් ප්‍රමාණය |
|---|---|---|---|
| 12 | 50 | 20 | 0 |
| 13 | 50 | 30 | 10 |
| 14 | 50 | 40 | 20 |
| 15 | 50 | 50 | 30 |
| 16 | 50 | 60 | 40 |

භාණ්ඩ ඒකකයක් සඳහා අය කරනු ලැබූ බද්දේ ප්‍රමාණය කොපමණ ද?
(1) රුපි. 2 (2) රුපි. 3 (3) රුපි. 4 (4) රුපි. 5 (5) රුපි. 6 (……)

**9.** බෝල්පොයින්ට් පෑන් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාව –3.0කි. බෝල්පොයින්ට් පෑනක මිල රුපි. 25ක් වන විට පෑන් 300ක් ඉල්ලුම් කරනු ලැබේ. පෑනක මිල රුපි. 20 කට අඩුවුවහොත්, කොපමණ ප්‍රමාණයක් ඉල්ලුම් කරනු ලැබේ ද?
(1) 900 (2) 630 (3) 560 (4) 480 (5) 180 (……)

**10.** කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ සඳහා වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රය වමට විතැන් වනුයේ,
(1) තාක්ෂණය වැඩි දියුණු වන විට දී ය.
(2) යෙදවුම් මිල ගණන් පහළ වැටෙන විට දී ය.
(3) යෙදවුම් මිල ගණන් ඉහළ නගින විට දී ය.
(4) තාක්ෂණය වැඩි දියුණු වන විට හා යෙදවුම් මිල ගණන් පහළ වැටෙන විට දී ය.
(5) කර්මාන්තය තුළට සැපයුම්කරුවන් වැඩි වැඩියෙන් ප්‍රවේශ වන විට දී ය. (……)

PAPERMASTER.LK


**11.** X භාණ්ඩය සඳහා ඇති සැපයුම් වක්‍රය පහත දැක්වෙන සමීකරණයෙන් පෙන්නුම් කෙරේ.

$Q_X = 6 P_X$

මෙහි $Q_X$ යනු X භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය වන අතර $P_X$ යනු X භාණ්ඩයේ මිල ය. X භාණ්ඩයේ සැපයුමේ මිල නම්‍යතාව පිළිබඳව මෙම සමීකරණයෙන් නිගමනය කළ හැක්කේ කුමක් ද?

(1) සැපයුමේ මිල නම්‍යතාව 6.0 කි. (2) සැපයුමේ මිල නම්‍යතාව 1.0 කි.
(3) සැපයුමේ මිල නම්‍යතාව 0.1 කි. (4) සැපයුමේ මිල නම්‍යතාව 0.0 කි.
(5) සැපයුමේ මිල නම්‍යතාව 0.6 කි. (......)

**12.** X භාණ්ඩය මත පනවා තිබූ විශේෂිත බද්දක් ඉවත් කළ පසුව, සැපයුම $S_2$ සිට $S_1$ දක්වා වැඩි වන බව පහත සඳහන් රූප සටහන පෙන්වයි. $S_1$ සැපයුම් වක්‍රය, බද්ද පැනවීමට පෙර තිබූ සැපයුම් වක්‍රය සේම බද්ද ඉවත් කළ පසු දක්නට ඇති සැපයුම් වක්‍රය ද වේ.




බද්ද ඉවත් කිරීම, බදු අයභාරය සහ පාරිභෝගික වියදම මත කෙබඳු බලපෑමක් ඇති කරනු ලැබේ ද?


| | බදු අයභාරය | පාරිභෝගික වියදම |
|---|---|---|
| (1) | 1 440 කින් අඩු වේ. | 2 000 කින් වැඩි වේ. |
| (2) | 480 කින් අඩු වේ. | 560 කින් අඩු වේ. |
| (3) | 480 කින් අඩු වේ. | 560 කින් වැඩි වේ. |
| (4) | 960 කින් වැඩි වේ. | 1 440 කින් වැඩි වේ. |
| (5) | 1 440 කින් අඩු වේ. | 960 කින් අඩු වේ. |

(......)

**13.** ආදේශන ප්‍රතිවිපාකය යනු පහත සඳහන් කරුණක ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හටගන්නා වෙනස්වීම ය. එනම්,

(1) අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස් වීමකි.
(2) මූර්ත ආදායම නොවෙනස්ව තිබිය දී නිරපේක්ෂ මිල වෙනස් වීමකි.
(3) මුදල් ආදායම නොවෙනස්ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස් වීමකි.
(4) සාපේක්ෂ මිල නොවෙනස්ව තිබිය දී මූර්ත ආදායම වෙනස් වීමකි.
(5) සාපේක්ෂ මිල නොවෙනස්ව තිබිය දී මුදල් ආදායම වෙනස් වීමකි. (......)

**14.** කිසියම් රටක් විසින් ආනයනය කරනු ලබන පරිභෝජන භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් වක්‍රය මෙම රූපසටහන පෙන්නුම් කරයි. එම භාණ්ඩය මත ඒකකයකට $P_1 - P_2$ ප්‍රමාණයේ ආනයන බද්දක් රජය විසින් පනවනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් හටගන්නා පාරිභෝගික අතිරික්තයේ අඩු වීම හා ආණ්ඩුවේ අයභාරයේ වැඩි වීම මැනෙනුයේ රූප සටහනේ කවර ප්‍රදේශයකින් ද?





| | පාරිභෝගික අතිරික්තය අඩු වීම | ආණ්ඩුවේ අයභාරය වැඩි වීම |
|---|---|---|
| (1) | A + B | B + C |
| (2) | A + B + C | B |
| (3) | A + B | B + C + D + E |
| (4) | D | B + D |
| (5) | B + C | B |

(......)

PAPERMASTER.LK

[හතරවැනි පිටුව බලන්න.

**15.** කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.




මෙම භාණ්ඩයේ සැපයුම පූර්ණ නම්‍ය බවත් ආරම්භයේ දී එහි මිල $P_1$ වශයෙන් පැවති බවත් සලකන්න. එම භාණ්ඩය මත බද්දක් පැනවීම නිසා, මිල $P_1$ සිට $P_2$ දක්වා වැඩි වූයේ නම්, බද්ද නිසා හට ගන්නා අධි බදු බර කොපමණ වේ ද?

(1) $P_3 A P_4$ ප්‍රදේශය (2) ADB ප්‍රදේශය (3) $P_1 P_4 C$ ප්‍රදේශය
(4) $P_1$ C B $P_2$ ප්‍රදේශය (5) B F C ප්‍රදේශය (……)

**16.** ආයතනයක් සියලු ම යෙදවුම් 50% කින් වැඩි කරන විට නිමැවුම 40% කින් ඉහළ නගී. මෙම තත්ත්වය පෙන්නුම් කරනුයේ,

(1) හීනවන ඵල නීතියයි. (2) අඩුවන පරිමාණානුකූල ඵල නීතියයි.
(3) විචල්‍ය සාධකානුපාත නීතියයි. (4) වැඩිවන පරිමාණානුකූල ඵල නීතියයි.
(5) ආන්තික ඵල නීතියයි. (……)

**17.** අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා පහළ මිල පරාසයේ දී, පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක සැපයුම් වක්‍රය,

(1) පවත්නා වෙළෙඳපොළ මිලේ දී තිරස් අක්ෂයට සමාන්තර රේඛාවක් වේ.
(2) ශුන්‍ය නිමැවුමේ දී සිරස් රේඛාවක් වේ.
(3) ආයතනයේ ආන්තික පිරිවැය වක්‍රයට ම සමාන වේ.
(4) ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ම සමාන වේ.
(5) ධන නිමැවුමක් සහිත ව ඉහළට බෑවුම් වේ. (……)

**18.** තරගකාරී වෙළෙඳපොළක කටයුතු කරන නිෂ්පාදන ආයතනයක ලාභ උපරිමනය කෙරෙන නිමැවුම් මට්ටම නිර්ණය වන ලක්ෂ්‍යයේ දී

(1) ආන්තික පිරිවැය පහළ බසිමින් පවතී.
(2) ආන්තික පිරිවැය ඉහළ නගිමින් පවතී.
(3) ආන්තික අයභාරය ඉහළ නගිමින් පවතී.
(4) ආන්තික පිරිවැය අවම මට්ටමේ පවතී.
(5) ආන්තික පිරිවැය ආන්තික අයභාරයට වඩා පහළින් පවතී. (……)

**19.** නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී කිසිවක් නිෂ්පාදනය නොකරන්නේ නම්, පහත සඳහන් පිරිවැය අතුරෙන් ශුන්‍ය අගයක් ගනුයේ කවර පිරිවැයක් ද?

(1) ආවස්ථික පිරිවැය (2) මුළු විචල්‍ය පිරිවැය
(3) මුළු ස්ථාවර පිරිවැය (4) සාමාන්‍ය මුළු පිරිවැය
(5) මුළු පිරිවැය (……)

**20.** ආදායමේ චක්‍රීය ප්‍රවාහ ආකෘතිය තුළ ඇතුළත් 'මූර්ත' ප්‍රවාහ අතුරෙන් එකක් වන්නේ,

(1) ආයතන වෙතින් කුටුම්බ කරා ඇදෙන භාණ්ඩ හා සේවා ප්‍රවාහයයි.
(2) ආයතන වෙතින් කුටුම්බ කරා ඇදෙන සාධක සේවා ප්‍රවාහයයි.
(3) කුටුම්බ වෙතින් ආයතන කරා ඇදෙන භාණ්ඩ හා සේවා ප්‍රවාහයයි.
(4) ආයතන වෙතින් කුටුම්බ කරා ගලා යන මුදල් ගෙවීම් ප්‍රවාහයයි.
(5) කුටුම්බ වෙතින් ආයතන කරා ගලා යන මුදල් ගෙවීම් ප්‍රවාහයයි. (……)

**21.** පසුගිය වර්ෂයේ දී කිසියම් රටක පොදු මිල මට්ටම ඉහළ ගිය නමුදු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය නොවෙනස් ව තිබුණි යැයි සලකන්න. මෙම තොරතුරුවලට අනුව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

| | නාමික දළ දේශීය නිෂ්පාදිතය | මූර්ත දළ දේශීය නිෂ්පාදිතය |
|---|---|---|
| (1) | ඉහළ ගියේ ය. | ඉහළ ගියේ ය. |
| (2) | නොවෙනස්ව තිබිණි. | නොවෙනස්ව තිබිණි. |
| (3) | පහළ වැටුණි. | පහළ වැටුණි. |
| (4) | ඉහළ ගියේ ය. | නොවෙනස්ව තිබිණි. |
| (5) | පහළ වැටුණි. | ඉහළ ගියේ ය. |

(……)

PAPERMASTER.LK

**22.** පහත සඳහන් දෑ අතුරෙන්, පෞද්ගලික ආදායම ගණනය කිරීමේ දී ඇතුළත් කර ගන්නා නමුදු ජාතික ආදායම ගණනය කිරීමේ දී බැහැර කෙරෙන්නේ කවරක් ද?

(1) සමාගමික ලාභාංශ
(2) සංක්‍රාම ගෙවීම්
(3) සමාජ ආරක්ෂණ දායක මුදල්
(4) සමාගමික නොබෙදූ ලාභ
(5) ශුද්ධ පොලිය (……)

**23.** සරල ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 250 + 0.75\,Y$ බවත්, ආයෝජනය $I = 450$ බවත් උපකල්පනය කරන්න. මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම් මට්ටම

(1) 1 800 කි. (2) 2 800 කි. (3) 3 600 කි. (4) 7 200 කි. (5) 9 000 කි. (……)


**24.** ආයෝජන ගුණකයේ වටිනාකම වැඩි වන්නේ පහත සඳහන් කවර කරුණක වැඩිවීමක් නිසා ද?

(1) මුදල් සැපයුම
(2) සමතුලිත නිමැවුම
(3) පෞද්ගලික ආදායම් බදු අනුපාතිකය
(4) ආන්තික පරිභෝජන නැඹියාව
(5) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (……)

**25.** ආර්ථිකයේ චක්‍රීය ආදායම් ප්‍රවාහයට කරනු ලබන විදීමක් (injection) නියෝජනය කරනුයේ පහත දැක්වෙන කවරක් ද?

(1) වෙළෙඳ ශේෂයේ හිඟයක්
(2) ආණ්ඩුවේ අයවැය ලේඛනයේ හිඟයක්
(3) ශුද්ධ බදු ඉහළ යාමක්
(4) පෞද්ගලික සමාගම්වල රඳවාගනු ලැබූ ලාභ
(5) කුටුම්බ ඉතුරුම් (……)

**26.** කිසියම් ආර්ථිකයක සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පහත දැක්වෙන රූප සටහන පෙන්නුම් කරයි.




මෙම ආර්ථිකයේ ජාතික ආදායම් මට්ටම $Y_3$ සහ සමාහාර වියදම් ශ්‍රිතය $AE_1$ වේ නම්,

(1) ආර්ථිකය සමතුලිත වේ.
(2) අනපේක්ෂිත තොග සමුච්චනයක් සහ ජාතික ආදායම ඉහළ යාමක් සිදු වේ.
(3) අනපේක්ෂිත තොග සමුච්චනයක් සහ ජාතික ආදායම පහළ වැටීමක් සිදු වේ.
(4) අනපේක්ෂිත තොග අඩු වීමක් සහ ජාතික ආදායම ඉහළ යාමක් සිදු වේ.
(5) අනපේක්ෂිත තොග අඩුවීමක් සහ ජාතික ආදායම පහළ වැටීමක් සිදු වේ. (……)

**27.** මුදල් ප්‍රමාණවාදයට අනුව නාමික මුදල් සැපයුමෙහි 10% ක වැඩි වීමක් නිසා,

(1) මූර්ත මුදල් සැපයුම 10% කින් ඉහළ යනු ඇත.
(2) මූර්ත නිමැවුම 10% කින් ඉහළ යනු ඇත.
(3) පොලී අනුපාතිකය 10% කින් පහළ වැටෙනු ඇත.
(4) පොදු මිල මට්ටම 10% කින් ඉහළ යනු ඇත.
(5) එයට හිලව් වශයෙන් මුදලේ සංසරණ ප්‍රවේගය පහළ වැටෙනු ඇත. (……)

**28.** රටක ජාතික ආදායම පූර්ණ සේවා නියුක්ති මට්ටමේ ඇතැයි උපකල්පනය කරන්නේ නම්, උද්ධමනයක් ඇති වීමට වඩාත් හේතු වන්නේ පහත සඳහන් කවර තත්ත්වයක් ද?

(1) පොලී අනුපාතිකයේ පහළ යාමක්
(2) ශ්‍රම ඵලදායීතාවයේ ඉහළ යාමක්
(3) විනිමය අනුපාතිකයේ අගය ඉහළ යාමක්
(4) ආන්තික ආයාත නැඹියාවේ ඉහළ යාමක්
(5) පෞද්ගලික ආදායම් බදු අනුපාතිකයේ ඉහළ යාමක් (……)

**29.** වාණිජ බැංකුවලට මුදල් මැවිය හැක්කේ,

(1) සංචිත සුරැකුම්පත්වලට මාරු කිරීමෙනි.
(2) මහ බැංකුවෙන් භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීමෙනි.
(3) අතැති මුදල් මහ බැංකුව වෙත යැවීමෙනි.
(4) 100% ක සංචිත අවශ්‍යතාවක් පවත්වා ගැනීමෙනි.
(5) අධි සංචිත ගනුදෙනුකරුවන්ට ණය වශයෙන් ලබා දීමෙනි. (……)

PAPERMASTER.LK

**30.** එක්තරා පුද්ගලයකු තම වාණිජ බැංකු තැන්පතු ගිණුමෙන් රුපි. 10 000ක් ආපසු ගනු ලැබේ යැයි සලකන්න. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය 20% ක් වේ නම් සහ අනෙකුත් කරුණු කිසිවක් නොවෙනස්ව පවතී නම් මෙම ගනුදෙනුව නිසා සෘජුව ම,
(1) මුදල් සැපයුම රුපි. 10 000කින් අඩු වේ. (2) බැංකු තැන්පතු රුපි. 10 000කින් අඩු වේ.
(3) මුදල් සැපයුම රුපි. 50 000කින් අඩු වේ. (4) බැංකු තැන්පතු රුපි. 50 000කින් අඩු වේ.
(5) බැංකු තැන්පතු රුපි. 8 000කින් අඩු වේ. (......)

**31.** ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු තම ව්‍යවස්ථාපිත සංචිත තබාගනුයේ,
(1) අතැති මුදල් සහ මහ බැංකු තැන්පතු වශයෙනි.
(2) අතැති මුදල් සහ භාණ්ඩාගාර බිල්පත් වශයෙනි.
(3) බැංකුවේ සේප්පුවල ඇති රත්‍රං සහ විදේශ ව්‍යවහාර මුදල් වශයෙනි.
(4) ක්ෂණික ව ලබා ගත හැකි වෙනත් වාණිජ බැංකුවල තැන්පතු වශයෙනි.
(5) මහ බැංකුවේ පවත්වා ගනු ලබන තැන්පතු සහ විදේශ ව්‍යවහාර මුදල් වශයෙනි. (......)

**32.** මහ බැංකුව විසින් වාණිජ බැංකුවලින් භාණ්ඩාගාර බිල්පත් මිල දී ගන්නේ නම්, වාණිජ බැංකු සංචිතවලට සහ මුදල් සැපයුමට කුමක් සිදු වේ ද?

| | බැංකු සංචිත | මුදල් සැපයුම |
|---|---|---|
| (1) | වැඩි වේ. | අඩු වේ. |
| (2) | වැඩි වේ. | වැඩි වේ. |
| (3) | අඩු වේ. | අඩු වේ. |
| (4) | අඩු වේ. | වැඩි වේ. |
| (5) | වැඩි වේ. | වෙනස් නොවේ. |

(......)

**33.** පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැති සහ පරිභෝජනයෙන් බැහැර කරලීමේ හැකියාවක් නොමැති භාණ්ඩයක්,
(1) ශුද්ධ පෞද්ගලික භාණ්ඩයක් විය නොහැකි ය.
(2) ශුද්ධ පොදු භාණ්ඩයක් විය නොහැකි ය.
(3) බාල භාණ්ඩයක් විය නොහැකි ය.
(4) අර්ධ පොදු භාණ්ඩයක් විය නොහැකි ය.
(5) ගෝලීය පොදු භාණ්ඩයක් විය නොහැකි ය. (......)

**34.** ප්‍රතික්‍රමික ආදායම් බද්දක් ක්‍රියාත්මක වන විට දී දිළින්දෝ,
(1) තම ආදායමින් ධනවත් අයට වඩා අඩු ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති.
(2) ධනවත් අයට වඩා වැඩි රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(3) තම ආදායම් මට්ටම සමග සමානුපාතික ව වෙනස් වන බද්දක් ගෙවති.
(4) ධනවත් අයට වඩා අඩු රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(5) තම ආදායමින් ධනවත් අයට වඩා වැඩි ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති. (......)

**35.** වැඩිපුර තවත් එක් පුද්ගලයකුට ශුද්ධ පොදු භාණ්ඩයක් භාවිත කිරීමට ඉඩ සලසා දීමේ ආන්තික සමාජ පිරිවැය,
(1) ඍණ වේ. (2) ශුන්‍ය වේ. (3) ධන වේ.
(4) අපරිමිත වේ. (5) භාවිත කරන්නන් සංඛ්‍යාව වැඩි වෙත්ම ඉහළ නගී. (......)

**36.** නිදහස් වෙළෙඳපොළක් තුළ නිෂ්පාදනය කෙරෙන එක්තරා භාණ්ඩයක සමතුලිත නිමැවුම් මට්ටමේ දී එම භාණ්ඩයේ ආන්තික පෞද්ගලික හා බාහිර ප්‍රතිලාභත්, ආන්තික පෞද්ගලික හා බාහිර පිරිවැයත් වගුවෙහි දැක්වේ.

| අයිතමය | රුපි. මිලියන | අයිතමය | රුපි. මිලියන |
|---|---|---|---|
| ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ | 36 | ආන්තික පෞද්ගලික පිරිවැය | 24 |
| ආන්තික බාහිර ප්‍රතිලාභ | 18 | ආන්තික බාහිර පිරිවැය | 0 |

මෙම වෙළෙඳපොළට රජය මැදිහත් වීමෙන් සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ දැමිය හැකි ය. මක් නිසාද යත් එම භාණ්ඩය,
(1) පොදු භාණ්ඩයක් වන බැවිනි. (2) ශුභ සාධන භාණ්ඩයක් වන බැවිනි.
(3) අවගුණ භාණ්ඩයක් වන බැවිනි. (4) ගෝලීය පොදු භාණ්ඩයක් වන බැවිනි.
(5) බාල භාණ්ඩයක් වන බැවිනි. (......)

**37.** අයවැය හිඟය මූල්‍යනයට යොදා ගනු ලබන පහත සඳහන් ක්‍රම අතුරෙන්, සමාහාර ඉල්ලුම විශාලත ම ප්‍රමාණයකින් වැඩි කළ හැක්කේ කවරක් මගින් ද?
(1) විදේශිකයන්ට පිළිණපත් අලෙවි කිරීම (2) මහ බැංකුවට පිළිණපත් අලෙවි කිරීම
(3) වාණිජ බැංකුවලට පිළිණපත් අලෙවි කිරීම (4) ජාතික ඉතිරි කිරීමේ බැංකුවට පිළිණපත් අලෙවි කිරීම
(5) සේවක අර්ථසාධක අරමුදලට පිළිණපත් අලෙවි කිරීම (......)

PASTPAPERMASTER.LK

**38.** පහත වගුව සැලකිල්ලට ගන්න.

| වර්ෂය | අපනයන මිල දර්ශකය | වෙළෙඳ අනුපාත දර්ශකය |
|---|---|---|
| 1 | 100 | 100 |
| 2 | 90 | 80 |
| 3 | 80 | 60 |

මෙම දත්තවලට අනුව එළැඹිය හැකි නිගමනයක් වන්නේ අදාළ කාල පරිච්ඡේදයේ දී
(1) අපනයන මිල ඉහළ නගිමින් පැවති බව ය.
(2) ආනයන මිල ඉහළ නගිමින් පැවති බව ය.
(3) වෙළෙඳ අනුපාතයේ වැඩි දියුණු වීමක් සිදු වූ බව ය.
(4) සමාන අපනයන ප්‍රමාණයකින් වැඩි ආනයන ප්‍රමාණයක් ලබා ගත හැකි වූ බව ය.
(5) අපනයන මිල ඉහළ යාම, ආනයන මිල ඉහළ යාමට වඩා විශාල වූ බව ය. (……)

**39.** කිසිදු භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කිරීමෙහිලා නිරපේක්ෂ වාසියක් නොමැති රටක් පිළිබඳ ව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) එම රටට සාපේක්ෂ වාසියක් ද හිමි නොවේ.
(2) අඩු ආවස්ථික පිරිවැයක් සහිත භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කිරීමෙන් එම රටට සාපේක්ෂ වාසියක් හිමිකර ගත හැක.
(3) එම රට අමුද්‍රව්‍ය අපනයනය කොට අවසාන භාණ්ඩ ආනයනය කරනු ඇත.
(4) පිරිවැය වාසියක් නොමැති නිසා කිසිදු රටක් එම රට සමග වෙළෙඳාම් කිරීමට කැමති නොවනු ඇත.
(5) එම රටේ ව්‍යවහාර මුදල් ඒකකයේ ජාත්‍යන්තර අගය ස්ථාවර ව පවතිනු ඇත. (……)

**40.** විදේශ විනිමය වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා රුපියල් සඳහා ඉල්ලුම ව්‍යුත්පන්න වනුයේ,
(1) ශ්‍රී ලංකාවේ අපනයන + ශ්‍රී ලංකාවෙන් පිටතට ගලා යන ප්‍රාග්ධන ප්‍රවාහ මගිනි.
(2) ශ්‍රී ලංකාවේ අපනයන + ශ්‍රී ලංකාවට පිටතින් ගලා එන ප්‍රාග්ධන ප්‍රවාහ මගිනි.
(3) ශ්‍රී ලංකාවේ ආනයන + ශ්‍රී ලංකාවෙන් පිටතට ගලා යන ප්‍රාග්ධන ප්‍රවාහ මගිනි.
(4) ශ්‍රී ලංකාවේ ආනයන + ශ්‍රී ලංකාවට පිටතින් ගලා එන ප්‍රාග්ධන ප්‍රවාහ මගිනි.
(5) ශ්‍රී ලංකා රජය පවත්වා ගනු ලබන විදේශ සංචිත මගිනි. (……)

**41.** සාපේක්ෂ වාසි පිළිබඳ පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?
(1) සාපේක්ෂ වාසිය තනිකර ම දේශගුණයේ වෙනස්කම් මත රඳා පවතී.
(2) සාපේක්ෂ වාසිය තනිකර ම සාධක සම්භාරයේ වෙනස්කම් මත රඳා පවතී.
(3) සාපේක්ෂ වාසියක් හිමිකර ගැනීමට රටක් නිරපේක්ෂ වාසියක් ද හිමිකර ගෙන සිටිය යුතු ය.
(4) මිල මට්ටම ඉහළ යන රටක්, කිසියම් සාපේක්ෂ වාසියක් අත් කරගෙන තිබුණ ද එය ද අහිමි කරගනු ඇත.
(5) ආණ්ඩුවේ විචක්ෂණශීලී ප්‍රතිපත්ති මගින් ඇතැම් භාණ්ඩ සඳහා සාපේක්ෂ වාසි නිර්මාණය කළ හැකි ය. (……)

**42.** අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී අපගේ දේශීය මුදල් ඒකකයේ බාහිර අගය වැඩිවීමක්
(1) ආනයනය කරනු ලබන භාණ්ඩවල දේශීය මිල පහළ හෙළයි.
(2) ආනයනය කරනු ලබන භාණ්ඩවල දේශීය මිල ඉහළ නංවයි.
(3) ආනයනය කරනු ලබන භාණ්ඩවල විදේශ මිල ඉහළ නංවයි.
(4) ආනයනය කරනු ලබන භාණ්ඩවල විදේශ මිල පහළ හෙළයි.
(5) විදේශීය රටක දී දේශීය මුදල් ඒකකයේ වටිනාකම පහළ හෙළයි. (……)

**43.** ශ්‍රී ලාංකික සමාගමකට තමන් සතුව මැදපෙරදිග ඇති ඇඟලුම් කර්මාන්තශාලාවකින් රුපි. මිලියන 40ක ලාභාංශයක් ලැබෙනවා යැයි සලකන්න. මෙම ගනුදෙනුව ද්විත්ව සටහන් මූලධර්මයට අනුව ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි වාර්තා කරනුයේ කෙසේ ද?
(1) ප්‍රාග්ධන ගිණුම බැර සහ මූල්‍ය ගිණුම හර
(2) ප්‍රාග්ධන ගිණුම හර සහ මූල්‍ය ගිණුම බැර
(3) ප්‍රාග්ධන ගිණුම බැර සහ ජංගම ගිණුම හර
(4) ජංගම ගිණුම බැර සහ මූල්‍ය ගිණුම හර
(5) ජංගම ගිණුම හර සහ මූල්‍ය ගිණුම බැර (……)

**44.** සමහර කර්මාන්තශාලා ස්වයංක්‍රියකරණය (automation) වීම නිසා ඇතැම් සාම්ප්‍රදායික සේවකයන් කුසලතා නොගැළපීමකට මුහුණපාන අතර, ඔවුන්ගෙන් සමහරු සේවා වියුක්තිකයන් බවට පත් වෙති. අනික් අතට පරිගණක ක්‍රියාකරුවන්ට ඉහළ ඉල්ලුමක් පවතී. මෙම විරැකියා ස්වරූපය වර්ගකරනුයේ,
(1) චක්‍රීය සේවා වියුක්තිය වශයෙනි.
(2) ඝර්ෂික සේවා වියුක්තිය වශයෙනි.
(3) ස්වාභාවික සේවා වියුක්තිය වශයෙනි.
(4) ව්‍යුහමය සේවා වියුක්තිය වශයෙනි.
(5) සැඟවුණු සේවා වියුක්තිය වශයෙනි. (……)

PAPERMASTER.LK

**45.** කිසියම් රටක් සංවර්ධනය අත්කර ගෙන ඇතැයි යන්න වඩාත් හොඳින් පෙන්නුම් කරනුයේ කවර වෙනසක් මගින් ද?
(1) එම රටේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි වීමක්
(2) එම රටට හිමි ලෝක අපනයන ප්‍රතිශතයේ වැඩි වීමක්
(3) එම රටේ ගෙවුම් ශේෂය යහපත් වීමක්
(4) එම රටේ මුදල් ඒකකයේ අගය ඉහළ යාමක්
(5) එම රටේ සාමාන්‍ය පුරවැසියාගේ ජීවන තත්ත්වයේ අභිවෘද්ධියක් (……)

**46.** මුළු යැපුම් අනුපාතය යනු,
(1) වැඩිහිටි ජනගහනයට ළමා ජනගහනයේ අනුපාතයයි.
(2) ශ්‍රම හමුදාවේ සේවා නියුක්ත ජනගහනයට සේවා වියුක්ත ජනගහනයේ අනුපාතයයි.
(3) වැඩ කරන වයසේ ජනගහනයෙන් පුද්ගලයන් 100කට වයස අවුරුදු 65ට වැඩි ජනගහනයේ අනුපාතයයි.
(4) වයස අවුරුදු 15ට වැඩි ජනගහනයට වයස අවුරුදු 15ට අඩු ජනගහනයේ අනුපාතයයි.
(5) වයස අවුරුදු 15 - 59 වයසේ ජනගහනයට වයස අවුරුදු 15ට අඩු සහ අවුරුදු 59ට වැඩි ජනගහනයේ අනුපාතයයි. (……)

**47.** 2012/13 සමීක්ෂණ දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකයේ ආංශික ව්‍යාප්තිය නිවැරදිව දැක්වෙනුයේ පහත සඳහන් කවර දත්ත පෙළකින් ද?

| | නාගරික අංශය% | ග්‍රාමීය අංශය% | වතු අංශය% |
|---|---|---|---|
| (1) | 4.5 | 10.2 | 16.3 |
| (2) | 2.5 | 6.7 | 12.9 |
| (3) | 4.2 | 7.5 | 10.6 |
| (4) | 2.1 | 7.6 | 10.9 |
| (5) | 3.1 | 7.9 | 10.2 |

(……)

**48.** පහත දැක්වෙන කෙබඳු ආර්ථික ගැටලුවක් ඇගැයීමෙහිලා ලෝරන්ස් වක්‍රය භාවිත කළ හැකි ද?
(1) ආර්ථිකයේ නිෂ්පාදන හා සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව
(2) වෙළෙඳ හවුල්කරුවන්ගේ සාපේක්ෂ වාසි
(3) රටවල් අතර විශේෂීකරණයේ තීව්‍රතාව
(4) ආදායම් බෙදීයාමේ සාධාරණත්වය
(5) සේවා වියුක්තිය හා මිල ස්ථායිතාව අතර සම්බන්ධතාව (……)

**49.** 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සහ සේවා නියුක්තියට, කෘෂිකර්මාන්ත අංශයේ දායකත්වය නිවැරදි ව දැක්වෙන්නේ පහත සඳහන් කවරක් මගින් ද?

| | දළ දේශීය නිෂ්පාදිතය% | සේවා නියුක්තිය% |
|---|---|---|
| (1) | 16.0 | 28.5 |
| (2) | 22.8 | 32.3 |
| (3) | 12.8 | 45.0 |
| (4) | 10.5 | 26.5 |
| (5) | 10.1 | 28.5 |

(……)

**50.** පහත සඳහන් රටවල් අතුරෙන් G7 කණ්ඩායමෙහි සාමාජිකයකු **නොවන** රට කුමක් ද?
(1) ජපානය (2) කැනඩාව (3) ප්‍රංශය (4) ඉතාලිය (5) රුසියාව (……)

* * *

PAPERMASTER.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස් :**

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**1.** (i) ආර්ථික සම්පත්වල ප්‍රභේද **හතර** කවරේ ද? එක් එක් ප්‍රභේදය සඳහා නිදසුන බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

(ii) නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක්, මධ්‍යගත සැලසුම් ආර්ථිකයකින් වෙනස් වන්නේ කවර ආකාරයන්ගෙන් ද? (ලකුණු 04 යි)

(iii) ආර්ථික විද්‍යාව තුළ ප්‍රාග්ධන සම්පතක් වශයෙන් මුදල් **නොසැලකෙන්නේ** ඇයි? (ලකුණු 04 යි)

(iv) ව්‍යවසායකයෙකු යනු කවරෙක් ද? වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ව්‍යවසායකයන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන්නේ ඇයි? (ලකුණු 04 යි)

(v) පෞද්ගලික දේපොළ සහ දේපොළ හිමිකම් ආරක්ෂා කිරීම වෙළෙඳපොළ ආර්ථිකයේ සාර්ථකත්වය සඳහා අතිශය තීරණාත්මක වන්නේ ඇයි? (ලකුණු 04 යි)

**2.** (i) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යනු කුමක් ද? නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් අඳින විට ඔබ උපකල්පනය කරන දෑ නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පිටතට විතැන් වීමට බලපාන හේතු කවරේ ද? (ලකුණු 02 යි)

(iii) වැඩෙන ආවස්ථික පිරිවැය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ හැඩය සම්බන්ධයෙන් මෙම සංකල්පයෙන් ගම්‍ය වන්නේ කවරක් ද? (ලකුණු 04 යි)

(iv) වී සහ රෙදිපිළි නිෂ්පාදනයේ දී වැඩෙන ආවස්ථික පිරිවැය තත්ත්වයට මුහුණ දෙන රටක් සඳහා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් අඳින්න. පහත සඳහන් සිදුවීම් නිසා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වෙනස් වන්නේ කෙසේ දැයි පෙන්වා දෙන්න.

(අ) වඩාත් හොඳ පොහොර වර්ගයක් අලුතින් සොයා ගැනීම

(ආ) නිෂ්පාදන ක්ෂේත්‍ර දෙකෙහි ම සේවා නියුක්ත කළ හැකි ශ්‍රම ප්‍රමාණයේ විශාල ප්‍රසාරණයක් හට ගැනීම

(ඉ) දැඩි ඉඩෝරයක් නිසා වගා කළ හැකි ගොවි බිම් ප්‍රමාණය 10%කින් අඩු වීම

(ඊ) නිෂ්පාදන පිරිවැය අඩු කෙරෙන නව තාක්ෂණයක් රෙදිපිළි කර්මාන්තය තුළ සොයා ගැනීම (ලකුණු 06 යි)

(v) නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

**3.** (i) පාරිභෝගික භාණ්ඩයක ඉල්ලුමේ මිල නම්‍යතාව තීරණය කරනුයේ කවර සාධක ද? (ලකුණු 04 යි)

(ii) පහළට බෑවුම් වන රේඛීය ඉල්ලුම් වක්‍රයක්, ඉහළ මිල පරාසයන්හි දී වඩාත් මිල නම්‍ය වන්නේත්, පහළ මිල පරාසයන්හි දී වඩාත් මිල අනම්‍ය වන්නේත් ඇයි? (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන භාණ්ඩයන්ගේ ආදායම් ඉල්ලුම් නම්‍යතාවන් මත ඔබ එම භාණ්ඩ 'සුඛෝපභෝගී', 'අත්‍යවශ්‍ය' හා 'බාල' වශයෙන් වර්ග කොට දක්වන්නේ කෙසේ ද?

(අ) බෝතල් කළ ජලය 1.3

(ආ) කව්පි −0.8

(ඉ) පාන් 0.5


(ඊ) ජංගම දුරකථන 1.8 (ලකුණු 04 යි)

PAPERMASTER.LK

[දෙවැනි පිටුව බලන්න

(iv) තරගකාරී වෙළෙඳපොළක අලෙවි වන භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.

දැන්, රජය එම භාණ්ඩය මත ඒකකයකට රුපි. 60ක් වන සේ දේශීය භාණ්ඩ බද්දක් නිෂ්පාදකයන් මත පනවනවා යැයි සිතන්න.




(අ) බද්දෙහි ප්‍රතිඵලයක් වශයෙන් පාරිභෝගික අතිරික්තය කොතරම් ප්‍රමාණයකින් වෙනස් වේ ද? (ලකුණු 02 යි)

(ආ) බද්දෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදක අතිරික්තය කොතරම් ප්‍රමාණයකින් වෙනස් වේ ද? (ලකුණු 02 යි)

(ඉ) දේශීය භාණ්ඩ බද්දෙන් රජය එකතු කර ගනු ලබන අයභාරය කොපමණ ද? (ලකුණු 02 යි)

(ඊ) බද්ද නිසා අහිමි වන ආර්ථික අතිරික්තයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02 යි)


4. (i) හීනවන ඵල සහ අඩුවන පරිමාණානුකූල ඵල අතර වෙනස කුමක් ද? (ලකුණු 04 යි)

(ii) ආන්තික පිරිවැය සහ සාමාන්‍ය මුළු පිරිවැය අතර පවත්නා සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) නිෂ්පාදක අතිරික්තය, ආර්ථික ලාභය සහ ආර්ථික බදු කුලිය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) පූර්ණ තරගකාරී කර්මාන්තයක සිටින නිෂ්පාදන ආයතනයක්, වෙළෙඳපොළ මිලට වඩා ඉහළ හෝ පහළ හෝ මිලක් තෝරා **නොගන්නේ** ඇයි? (ලකුණු 04 යි)

(v) පහත රූපසටහන පෙන්නුම් කරනුයේ කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී වෙළෙඳපොළක කටයුතු කරන නිෂ්පාදන ආයතනයක ඉල්ලුම් හා පිරිවැය වක්‍රයන් ය.




(අ) වෙළෙඳපොළ මිල රුපි. 160 දී ආයතනය උපයන ලාභය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ආයතනය නිෂ්පාදනය අත්හිටුවීමට තීරණය කරනුයේ කවර මිලක දී ද? (ලකුණු 02 යි)

5. (i) එකතු කළ අගය යනු කුමක් ද? එය ගණනය කරනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)

(ii) සමාහාර ආදායමේ ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන ගනුදෙනු, රටක දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළු කර ගන්නවා ද නැද්ද යන්න පැහැදිලි කරන්න.

(අ) විදේශයක නිෂ්පාදනය කරන ලද රුපි. මිලියන 10ක් වටිනා ටින් කෑම සංචාරක හෝටලයක් විසින් මිල දී ගැනීම

(ආ) නිෂ්පාදන සමාගමක් අගනුවර සිසිල් බීම බෝතල් කිරීමේ කම්හලක් අලුතින් ඉදි කිරීම

(ඉ) ආයෝජකයකු විසින් ප්‍රධාන වාණිජ බැංකුවක රුපි. මිලියන 30ක් වටිනා කොටස් මිල දී ගැනීම

(ඊ) පොත් ප්‍රකාශකයකු විසින් අලුත් පොතක පිටපත් විශාල සංඛ්‍යාවක් මුද්‍රණය කොට, එයින් මෙම වර්ෂයේ අලෙවි නොවූ අතිරික්ත පිටපත් සංඛ්‍යාව, සමාගමේ තොගවලට එකතු කිරීම (ලකුණු 04 යි)

(iv) එක්තරා ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු ම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.)

| | | |
|---|---|---|
| ස්වායත්ත පරිභෝජනය | = | 500 |
| සැලසුම් කළ ආයෝජනය (I) | = | 1 250 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) | = | 1 000 |
| ශුද්ධ අපනයන (NX) | = | –250 |
| ආන්තික පරිභෝජන නැඹියාව (MPC) | = | 0.8 |

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම නිර්ණය කරන්න. (ලකුණු 04 යි)

(v) එක්තරා ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු ම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.)

| | | |
|---|---|---|
| ජාතික ආදායම | = | 1 000 |
| පරිභෝජන වියදම් | = | 500 |
| ආණ්ඩුවේ වියදම් | = | 250 |
| ශුද්ධ අපනයන | = | 100 |
| අයවැය හිඟය | = | 40 |

(අ) වැය කළ හැකි ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකයේ ආයෝජන වටිනාකම කොපමණ ද? (ලකුණු 02 යි)

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**6.** (i) මුදල් ප්‍රමාණවාදය සහ විනිමය සමීකරණය අතර වෙනස කුමක් ද? (ලකුණු 04 යි)

(ii) ශ්‍රී ලංකාවේ ජීවන වියදම් මිනුමක් වශයෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයට වඩා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ඇති වාසි කවරේ ද? (ලකුණු 04 යි)

(iii) මිනිසුන් මුදල් ළඟ තබා ගන්නේ ඇයි? මිනිසුන් ළඟ තබා ගන්නා මුදල් ප්‍රමාණය කෙරෙහි ආදායම් මට්ටම කෙබඳු බලපෑමක් කරනු ලබයි ද? (ලකුණු 04 යි)

(iv) යම් කල්පිත ආර්ථිකයක, මුදල් සැපයුම (M) රුපි. බිලියන 3 600ක් ද, මුළු බැංකු තැන්පතු (D) රුපි. බිලියන 3 200ක් ද, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%ක් ද වන අතර, බැංකු සතුව අධි සංචිත නොමැති බව ද සලකන්න.

(අ) මෙම ආර්ථිකයේ මුදල් ගුණකයේ අගය කොපමණ ද? (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකයේ මුදල් සැපයුම රුපි. මිලියන 100කින් අඩු කිරීමට මහ බැංකුව කුමක් කළ යුතු ද? (ලකුණු 02 යි)

(v) ශ්‍රී ලංකාවේ අන්තර් බැංකු ඒක්ෂණ ණය අරමුදල් වෙළෙඳපොළෙහි පොලී අනුපාතික පාලනය කිරීම සඳහා මහ බැංකුව නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව මෙහෙය වන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)

**7.** (i) ආර්ථිකයක සම්පත් බෙදා වෙන්කිරීම අකාර්යක්ෂම කරවීමෙහිලා, බාහිරතා බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. යෝග්‍ය ප්‍රස්තාර සටහන් මගින් ඔබේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) පොදු භාණ්ඩ යනු කවරේ ද? එබඳු භාණ්ඩ වෙළෙඳපොළ මගින් පහසුවෙන් සැපයිය **නොහැක්කේ** මන්ද? (ලකුණු 04 යි)

(iii) බදු අය කිරීමේ අරමුණු කවරේ ද? (ලකුණු 04 යි)

(iv) යහපත් බදු ක්‍රමයක දක්නට ඇති හිතකර ගුණාංග සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) ශ්‍රී ලංකා ආණ්ඩුවේ පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 04 යි)

**8.** (i) සාපේක්ෂ වාසිය සහ නිරපේක්ෂ වාසිය අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

(ii) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන ඉපැයීම්වල මන්දගාමී වර්ධනයට හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාව වර්තමානයේ කලාපීය සහ ද්විපාර්ශ්වීය වශයෙන් ඇති කරගෙන ඇති නිදහස් වෙළෙඳ ගිවිසුම් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

PAPERMASTER.LK

(iv) ද්විත්ව සටහන් මූලධර්මය යොදා ගනිමින් පහත සඳහන් ගනුදෙනු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි ඔබ වාර්තා කරන්නේ කෙසේ ද?

(අ) චීන ආයෝජකයකු විසින් ඩොලර් මිලියන 10ක කොටස් කොළඹ සුරකුම්පත් හුවමාරුවෙන් මිලයට ගැනීම

(ආ) මැදපෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක් ඩොලර් 500ක මුදලක්, ලංකාවේ සිටින තම දෙමාපියන් වෙත එවීම

(ඉ) ශ්‍රී ලාංකික බැංකුවක් විදේශීය මූල්‍ය වෙළෙඳපොළවල පිළිණපත් අලෙවිකොට, ඩොලර් මිලියන 40ක් ලබා ගැනීම

(ඊ) ලෝකයේ ශීඝ්‍රයෙන් අලෙවි වන පොතක් පරිවර්තනය කොට ශ්‍රී ලංකාවේ අලෙවි කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ ප්‍රකාශන සමාගමක් ඇමෙරිකානු ප්‍රකාශන සමාගමකට ඩොලර් 5 000ක් ගෙවා එහි ප්‍රකාශන අයිතිය ලබා ගැනීම (ලකුණු 04 යි)

(v) පාවෙන විනිමය අනුපාතික ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගය, ඇමෙරිකානු ඩොලර්වලින් තීරණය වන ආකාරය පෙන්නුම් කිරීමට උචිත ප්‍රස්තාර සටහනක් අඳින්න. මෙම විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඉල්ලුම් වක්‍රය පහළට සහ සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

**9.** (i) සංවර්ධනය පිළිබඳ දර්ශකයක් වශයෙන් මානව සංවර්ධන දර්ශකය, ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායමට වඩා හොඳ දර්ශකයක් ලෙස සලකනු ලබන්නේ ඇයි? (ලකුණු 05 යි)

(ii) දිගු කාලීන ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීම පිණිස ආණ්ඩුවට ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

(iii) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම් පහළ වැටීමට දායක වී ඇති වැදගත් කරුණු කවරේ ද? (ලකුණු 05 යි)

(iv) "රාජ්‍ය ණය මගින් මූල්‍යනය කෙරෙන, වෙළෙඳ නොවන අංශ පදනම් කරගත් වෘද්ධි උපායමාර්ගයක්, ආර්ථිකය දිගු කාලීන තිරසාර වෘද්ධියක් කරා ගෙනයනු ඇතැයි අපේක්ෂා කළ නොහැකි ය." පසුගිය පස් වසර තුළ ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඇසුරෙන් මෙම ප්‍රකාශයේ වලංගුභාවය අගයන්න. (ලකුණු 05 යි)

**10.** (i) "නානාවිධ රාජ්‍ය මූල්‍ය සානුබල තිබියදීත් මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ඍජු විදේශ ආයෝජනයේ හැසිරීම, බලාපොරොත්තු කඩකරන්නක් වී තිබේ." ඍජු විදේශ ආයෝජන සඳහා ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රධාන බාධක කවරේ ද? (ලකුණු 05 යි)

(ii) ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය මූල්‍ය තත්ත්වයෙහි දක්නට ඇති ප්‍රධාන ව්‍යුහාත්මක දුර්වලතා සඳහන් කරන්න. (ලකුණු 05 යි)

(iii) ශ්‍රී ලංකාවේ මෑත වර්ෂවල වෙළෙඳ ශේෂයේ හිඟය පුළුල් වෙමින් පැවතීමට බලපාන හේතු දක්වන්න. (ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ දිගු කාලීන ආර්ථික වෘද්ධිය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි, ගෝලීය ආර්ථිකයේ වර්තමානයේ සිදු වන වෙනස්කම් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

***

PAPERMASTER.LK